# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1861/37 – 2014 මැයි 08 වැනි බ්‍රහස්පතින්දා – 2014.05.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලබඩ පත්තුව නැගෙනහිර සුළු කොට්ඨාසයේ, වලස්ගල ගමේ පිහිටි, මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක එම්ආර්/ඩීකේඩබ්/2012/610 හා 2013.02.09 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් කැබලි අක්ෂර 'ඒ' වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0150 ක් පමණ වූ ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – කොන්ගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0150 ක් පමණ

උතුරට: ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අත්කරගන්නා ලද ඉඩම සහ පෙරහැර මාවත; නැගෙනහිරට: පෙරහැර මාවත; දකුණට: එස්. එම්. කේමසරත් හිමිකම් කියන කොන්ගහවත්ත; බටහිරට: එස්. එම්. කේමසරත් හිමිකම් කියන කොන්ගහවත්ත සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අත්කරගන්නා ලද ඉඩම.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4/3/08/2012/එන්ආර්ඩී/261.
2013 අගෝස්තු මස 28 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

05 – 712


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.